**මදුරාවල ප්‍රාදේශීය සභාව - 2021**

----------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මදුරාවල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහාපාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතයේ 3.29 වගන්තිය ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම් වනුයේ මුදල් හා සමාන දෑ වල ඇතුළත් නොවන දිගු කාලීන වත්කම් සහ වෙනත් ආයෝජනවල අත්පත් කර ගැනීම් හා බැහැර කිරීම් වේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල දේපල , පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා මුදල් ගලා යාමක් සිදුවී නොතිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දේපල , පිරියත හා උපකරණ මිලදී ගැනීම් ලෙස රු.10,932,875 ක් දැක්වීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂවල අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු කරන බව | |
| (ආ) ප්‍රමිතයේ 6.10 වගන්තිය ප්‍රකාරව වත්කමක පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ අවශේෂ අගය අඩුකළ පසු ලැබෙන වටිනාකම මත ක්ෂය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීමේදී වත්කම්වල අවශේෂ අගයන් ඇස්තමේන්තු කර නොතිබුණ අතර වත්කම්වල පිරිවැය මත පදනම්ව ක්ෂය ගැලපීම් කර තිබුණි. | අවශේෂ අගය ගණනය කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් අවශේෂ අගය ශුන්‍ය ලෙස සලකා ක්ෂය කර ඇති බව | පළාත් පාලනය සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඇ) ප්‍රමිතයේ 18.6 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සඳහා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට සංක්‍රාන්ති වන දිනයට පෙර ගණුදෙනු , වෙනත් සිද්ධීන් , තත්ත්වයන් හෝ ප්‍රතිඵලයක් වශයෙන් පැන නගින ගැලපුම් සංක්‍රාන්ති වූ දින රඳවාගත් අතිරික්තයට ගැලපුම් ලෙස ඒවා අස්ථිත්වයක් විසින් හඳුනාගත යුතු වුවත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.225,223,566 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය ප්‍රකාශනවල වෙනම ගිණුමක් ලෙස දක්වා තිබුණි. | වර්ෂය තුලදී ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය සමුච්චිත අරමුදලට ගලපන බව | |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂයේ ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන වලින් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගත යුතු ප්‍රාග්ධන ප්‍රදාන රු.1,393,272 ක් වුවත්, ස්ථාවර වත්කම්වල ක්ෂය අනුපාතවල සිදුව තිබූ දෝෂයක් හේතුවෙන් එය රු.1,576,781 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ආ) විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගත යුතු රු.1,393,272 ක ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අයභාරය යටතේ දක්වා නොතිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි. | ශේෂ හඳුනාගෙන ඉදිරියේදී නිවැරදි කරන බව | |
| (ඇ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.9,098,515 න් ආදායමේ හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රදාන රු.1,393,272 අඩුකර දැක්විය යුතු වුවත්, රු.1,576,781 ක් එකතු කර දැක්වීම හේතුවෙන් වර්ෂයේ වෙනත් විස්තීර්ණ ආදායම් රු.2,970,053 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරිවර්ෂ වල අඩුපාඩු සිදු නොකරන බව | |
| (ඇ) 2021 දෙසැම්බර් 31 දිනට අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය රු.21,659,476 ක් වියයුතු වුවත්, එය රු.21,475,967 ක් ලෙස රු.183,509 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තතාව රු.183,509 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ඊ) සභාව සතු ඉඩම් 84 ක් හා ගොඩනැගිලි 05 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | හඳුනාගත නොහැකි ඉඩම් පවතින අතර හඳුනාගත හැකි සියළු ඉඩම් තක්සේරු කිරිම සඳහා යොමුකර ඇති බව | තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂය තුළ පළාත් සභා ව්‍යාපෘති යටතේ කසළ කළමනාකරණ ගොඩනැගිල්ල නවීකරණය කිරිම සඳහා වැයකර තිබූ රු.248,745 ක් ගොඩනැගිලි යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ඌ) 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.338,668 ක කර්මාන්ත තොග නිකුත් කිරිම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් කර්මාන්ත තොගය හා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |

| | | |
|---|---|---|
| (එ) විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයතුල ඉදි කර තිබුණු රු.3,410,000 ක් වූ නාර්තුපාන හා වල්පිට ක්‍රීඩාපිටි දෙක සභාවට පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවට පවරා දුන් වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | සභාවට පවරාගෙනගිණුම්ගත කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.337,255 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.884,440 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සභාවේ මුළු ආදායම රු.75,998,495 ක් වූ අතර ඉන් රු.55,279,748 ක් එනම් සියයට 73 ක්ම රජයෙන් ලද ආදායම වන අතර, සභාව විසින් හුවමාරු සහ හුවමාරු නොවන ගණුදෙනුවලින් ඉපැයූ ආදායම රු.20,718,747 ක් එනම් සියයට 27 ක් වීම හේතුවෙන් සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය ප්‍රශස්ථ මට්ටමක නොතිබුණ බව නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගතය නිසා ආදායම් අයකර ගැනීම අඩු මට්ටමක පැවති අතර ඉදිරි වර්ෂයේ සැලසුම් සකස් කර ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කරන බව | ආදායම් රැස්කිරීම් වැඩි කරවා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ)2016, 2017 හා 2018 වර්ෂයන්ට අදාලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කළ මුද්දර ගාස්තු රු.5,402,135 ක් හා උසාවි දඩ රු.1,762,109 ක් මේ දක්වා ලැබී නොතිබුණි. | මුද්දර ගාස්තු කොටසක් අයකර ඇති අතර උසාවි දඩ උපලේඛන සකස් කර යවා ඇති බව | හිග උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අය කළයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------------**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නාර්තුපාන බහුකාර්ය ගොඩනැගිල්ල කුළියට දීම | | |
| ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ පුරනැඟුම ව්‍යාපෘති මගින් 2016 වර්ෂයේ පිරිවැය රු.20,619,845 වැය කර අවසන් කරන ලද නාර්තුපාන බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) හෙක්ටයාර් 0.3277 ක් වූ ඉහත ගොඩනැගිල්ල ඉදිකර තිබුණ ඉඩමේ භුක්තිය මදුරාවල ප්‍රාදේශිය ලේකම් විසින් සභාවට භාර දී තිබුණද, 2022 මැයි 31 වන විටත් අයිතිය පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය අයදුම්පත් පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති බව | ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) ගොඩනැගිල්ල ඉදි කිරිමට පෙර ශක්‍යතා අධ්‍යනයක් කර සභාවේ අවශ්‍යතාවය හඳුනාගෙන ඉදි කිරීම් කළයුතු වුවත්, එසේ අවශ්‍යතාවය හඳුනා නොගෙන ඉදි කර තිබුණු පිරිවැය රු.20,619,845 වූ උක්ත ගොඩනැගිල්ල ඉදි කර සභාවට භාරදුන් 2016 නොවැම්බර් සිට අවස්ථා කිහිපයක පමණක් භාවිතා කලද වැඩි කාලයක් ඌන උපයෝජිතව පැවතුණි. | වැඩ සටහන් කිහිපයක් පවත්වාගෙන යනු ලබන බව | ඌණ උපයෝජිත වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළයුතුය. |